**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ
- බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 ( 1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ පරිශිෂ්ඨය 02 E.G 3.8 හෙළිදරව් කිරීම් අනුව දේපල පිරියත උපකරණ ක්ෂය සම්බන්ධයෙන් ක්ෂය කිරීමේ ක්‍රමය සහ වත්කම් වල ප්‍රයෝජ්‍ය ජීව කාලය හෝ ක්ෂය කිරීමේ අනුපාතිකයන් හෙළිදරව් කළ යුතු වුවත්, රු.34,728,454 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙනුවෙන් එලෙස හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | දේපල පිරියත හා උපකරණ ක්ෂය සම්බන්ධයෙන් වූ සියළු හෙළිදරව් කිරීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්ෂය ප්‍රතිපත්තිය හා ක්ෂය ප්‍රතිශතයන් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරිපත් කර ඇති පරිශිෂ්ඨය 2 හි 1 ඇමුණුමෙහි සඳහන් ගිණුම් කේත අනුව පුස්තකාල පොත් ශේෂය තොග යටතේ වත්කමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ රු.3,899,825 ක් වූ පුස්තකාල පොත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර සටහන් අංක 14 යටතේ හෙළිදරව් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ උපදෙස් අනුව සටහන් යටතේ දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එකවර | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය | ඉකුත් වර්ෂ වල සිට පෙන්වා දෙන මෙම |

| | | | |
|---|---|---|---|
| | ආදායමට හඳුනා නොගෙන ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස ලද රු.25,072,747 ක මුළු වටිනාකම විස්තීර්ණ ආදායමට අයකර තිබුණි. | අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පුනරාවර්ථන නොවන වියදම් ප්‍රදාන ක්ෂය අනුපාතයට සාපේක්ෂව වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | වරද නිවැරදි කළ යුතුවේ. |
| (ආ) | උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2019 දෙසැම්බර් 31 දිනැති අංක 2019/02 දරන චක්‍රලේඛයේ 06(v) ප්‍රකාරව මංමාවත් බෝක්කු හා පාලම් වාර්ෂිකව සියයට 10 බැගින් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කළ යුතු වුවත්, වර්ෂය ආරම්භයේ පැවති රු.32,000,000 ක වටිනාකම වෙනුවෙන් රු.3,200,000 ක් ක්ෂය වටිනාකම ගණනය නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් වර්ෂයේ වියදම අඩුවෙන් සහ වත්කම් වටිනාකම වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | මංමාවත්, බොක්කු හා පාලම්වලට අදාළ ආරම්භක ශේෂ වටිනාකම සඳහා ක්ෂය ගැලපීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | ක්ෂය වටිනාකාම නිවැරදිව ගණනය කළ යුතුවේ. |
| (ඇ) | ලැබිය යුතු වරිපනම් බදු ගිණුම් තැබීමේදී රු.2,348,435 ක් වූ කලින් ලද වරිපනම් බදු ආදායම හිලව් කර ගිණුම් තැබීම හේතුවෙන් එම වටිනාකමින් ලැබිය යුතු වරිපනම් බදු ආදායම අඩුවෙන් ගිණුම්ගත වී ඇති අතර, කලින් ලද වරිපනම් බදු ආදායම වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු වරිපනම් බදු ආදායම හා ඉදිරියට ලද වරිපනම් බදු ආදායම අතර ශුද්ධ ප්‍රතිඵලය ගිණුම්ගතකර ඇත. නමුත් ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වත්කම් හා වගකීම් සියල්ල පෙන්නුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි නිවරදිව ගිණුම් තැබීම සිදු කළ යුතුවේ . |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.8,106,562 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.46,276,912 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **කුලී** | | |
| (i) | 2016 අංක 945 දරණ පරිපාලන කමිටු තීරණය මත ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක් 2016 නොවැම්බර් 16 දින සිට මාසිකව රු.10,000 ක කුලී පදනමක් මත ගිවිසුම් ගතවීමෙන් තොරව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටුවීමට ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම ඊට අදාළ රු.610,000 ක් වූ කුලී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම් සිදු නොකරන්නේ නම් නිතිමය පියවර ගැනිමට කඩිනමින් කටයුතු කරමි. | හිඟ කුලි මුදල් අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. |
| **(ii)** | සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟව පැවති කඩ කාමර ශේෂයන්ගෙන් කඩ කාමර 66 කට අදාලව රු.3,385,074 ක වටිනාකමක් 2022 අගෝස්තු 31 වන විටත් හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනිමට කඩිනමින් කටයුතු කරමි. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |